# 12 ශ්‍රේණිය ව්‍යාපාර අධ්‍යයනය - 2 වන සතිය මැයි 11 සිට 15 දක්වා

නිපුණතාවය :- 8.1 ව්‍යාපාරවල පැවැත්මට හේතුවන රක්ෂණ සේවාවේ වැදගත්කම විමසයි

8.2 රක්ෂණයේ ප්‍රායෝගික භාවිතය සඳහා ඉවහල් වන රක්ෂණ මූලධර්ම විමසයි.

ව්‍යාපාරයක් ආරම්භකර පවත්වා ගෙනයාමේදී විවිධ හානීන් වලට මුහුණ දීමට ඉඩ තිබේ. මෙලෙස සිදුවන හානීන් අවධානම් ලෙස අප හඳුන්වයි. මෙලෙස ව්‍යාපාර මුහුණදෙනු ලබන සියලුම අවධානම් රක්ෂණය කළ නොහැකි බව අපි දනිමු. එසේනම් රක්ෂණය කළ හැකි අවධානම් හඳුනාගෙන එම අවධානම් වලින් ව්‍යාපාරයට සිදුවන පාඩුව අවම කිරීමත්, ව්‍යාපාර වල පැවැත්ම හා වර්ධනය සඳහාත්, රක්ෂණය දායකවේ.

මේ අනුව ව්‍යාපාරයක රක්ෂණ ආවරණයක් ලබා ගැනීමට අදහස් කරන පුද්ගලයා විසින් ඉදිපත් කරන රක්ෂණ යෝජනා පත්‍රය රක්ෂණ ආයතනයක් විසින් පිළිගත් පසු දෙපාර්ශවය අතර ඇතිවන ලිඛිත එකඟතාවය රක්ෂණ ගිවිසුමක් ලෙස හඳුන්වයි. රක්ෂණයට සම්බන්ධ ප්‍රධාන පාර්ශවයන් දෙකක් ඇත.

01. රක්ෂකයා

02. රක්ෂිතයා වේ. මීට අමතරව ගිවිසුමට අදාළ ඇතිවන බාහිර පාර්ශව සම්බන්ධතාවය තෙවන පාර්ශවය ලෙසද හඳුන්වයි.

එසේම රක්ෂණ ගිවිසුමක් වලංගු වීම සඳහා පහත සඳහන් මූලිකාංගද පැවතිය යුතුවේ.

- නෛතික බැඳීමක් ඇතිකර ගැනීමේ අදහස
- අර්පනය හෙවත් යෝජනාව
- ප්‍රතිග්‍රහණය හෙවත් පිළිගැනීම
- නෛතික බව - නීතියට එකඟ බව
- ඒ ඒ පාර්ශවයන්ට නෛතික බැඳීමක් ඇති කර ගැනීමට ඇති හැකියාව වේ.

රක්ෂණයේ පැවැත්ම සඳහාත් රක්ෂණය ප්‍රායෝගිකව භාවිතාකිරීමේදීත් රක්ෂණ මූලධර්ම මත ක්‍රියාකරනු ලබයි.ඒවානම්

1. රක්ෂ්‍ය හිමිකම 2. උපරිම විශ්වාසය 3. හානිපූර්ණය

4. ආදේශනය 5. දායකත්වය 6. ආසන්නම හේතුව වේ.

**ඉහත සඳහන් කරුණු අධ්‍යයනය කර පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**01.** **සමන් විදේශ රටක සිට මෙරටට පැමිණ ඇත. ඔහු මෙරට තමන්ගේ නමින් කුඩා පරිමාණයේ ඇඟළුම් නිර්මාණ ආයතනයක් පවත්වාගෙන යාමට අදහස් කරයි. ඔහු තම පුද්ගලික ධනය මේ සඳහා යෙදවීමට කටයුතුකර ඇත. එසේම මේ සඳහා ඇතිවිය හැකි අවදානම් තත්වය ගැන අවධානය යොමු කර ඒ සඳහා රක්ෂණාවරණයක් ලබාගැනීමට අදහස්කරයි.**

**මොහු රක්ෂණාවරණය ලබාගැනීමට අදහස් කරන රක්ෂණ ආයතනයේ නියෝජිතයා ඔබයැයි සිතා ඔහුට ඇතිවී ඇති පහත ගැටළුවලට විසඳුම් පැහැදිලි කරන්න.**

**I.** **සමන්ගේ ව්‍යාපාරයේ පැවැත්ම සඳහා රක්ෂණය වැදගත් වන ආකාරය පැහැදිලි කර රක්ෂණය කළ හැකි අවදානම් හා රක්ෂණය කළ නොහැකි අවදානම් හඳුන්වා දෙන්න.**

**II.** **සමන්ට යම් අවදානමක් සඳහා මුහුණ දීමට සිදු වුවහොත් ඒ සඳහා වන්දි හිමිකම් ලබාගැනීමේදී රක්ෂණ සමාගම රක්ෂණ මූලධර්මවලට අනුකූලව ක්‍රියා කරන බවත් එම රක්ෂණ මූලධර්ම පිළිබඳවත් සමන්ට පැහැදිලි කර දෙන්න.**